ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No. |  ඔබේ අංකය / உமது இல. / Your No. |  දිනය / திகதி / Date } 2021.11.08

පැමිණිලි පාර්ශවය : ජේ.එල් පත්මසිරි මයා,
අංක : 119/23, ඇඹරළුව උතුර,
වැලිවේරිය.

වගඋත්තර පාර්ශවය : 01. උ.පො.ප අසේල මයා,
අපරාධ අංශය,
පොලිස් ස්ථානය, වැලිවේරිය.

02. ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
වැලිවේරිය.

**පැමිණිලි අංකය : HRC/2112/17**

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා 2017.06.19 වන දින රාත්‍රී 10.30 ට පමණ වැඩ අවසන් කර තවත් පුද්ගලයන් දෙදෙනෙකුද සමඟ යතුරු පැදි දෙකකින් වැලිවේරිය නගරයේ පිහිටි මාතර කඩේ වෙත ගිය අවස්ථාවේදී එම කඩය අසලදී සිවිල් ඇඳුමින් සැරසුනු නිලධාරීන් 04 දෙනකු පැමිණ කිසිදු විමසීමකින් හෝ පැහැදිලි කිරීමකින් තොරව තමාට අමානුෂික අන්දමින් පහරදුන් බවත්, පසුව පොලිස් ස්ථානයටද රැගෙන ගොස් පහරදුන් බවත්ය. වෙළඳසැල් හිමියාද තමා සහ අනෙක් පුද්ගලයන් දෙදෙනා හඳුනන බවට පොලිස් නිලධාරීන්ට ප්‍රකාශ කළ නමුත් කිසිදු විභාගයකින් තොරව පහරදී පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත් දක්වා ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone } 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

පැමිණිල්ලේ සාක්ෂි වශයෙන් අයි.ටී චමින්ද පුෂ්පකුමාර යන අය දිවුරුමු ප්‍රකාශයක් ලබා දී ඇති අතර, එම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් වන්නේ පැමිණිලිකරු සමඟ වැලිවේරිය මාතර කඩයට ගිය බවත්, එහිදී පොලිස් නිලධාරීන් පැමිණ පැමිණිලිකරුට පහරදී පැමිණිලිකරුව සමඟ ඔවුන්වද පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත්ය.

පැමිණිල්ලේ සාක්ෂි වශයෙන් බි.එල්.ඒ චමින්ද නැමැති යන අය විසින් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2017.06.19 වන දින වැඩ අවසන් වී තමාත්, පැමිණිලිකරුත්, චමින්ද පුෂ්පකුමාරන් යන අයත් යතුරුපැදි දෙකකින් බඩු මිළදී ගැනීම සඳහා මාතර කඩය අසලට පැමිණි බවත්, පැමිණිලිකරු මුදලාලි සමඟින් කතා කරමින් සිටියදී එම ස්ථානයට පැමිණි සිවිල් ඇඳුමින් සැරසුනු 4 දෙනෙක් පැමිණිලිකරුට පහරදුන් බවත්, පසුව වැලිවේරිය පොලිස් ස්ථානයට රැගෙන ගොස් සිර මැදිරියට දැමූ බවත්, ඒ අවස්ථාවේදී අසේල නැමැති මහතෙකු පැමිණ අමානුෂික අන්දමින් පහරදුන් බවත්ය.

පහරදීම තහවුරු කිරිම සඳහා අධිකරණ වෛද්‍ය වාර්තා කැඳවා ඇති අතර, අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව බරපතල තුවාල ඇති බවට සටහන් වී ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

පළවන වගඋත්තරකරු සිය කරුණු දැක්වීම මඟින් ප්‍රකාශ කර ඇත්තේ තමා වැලිවේරිය පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති ලෙස සේවය කළ බවත්, දැනට පල්ලේවෙල පොලිස් ස්ථානයේ සේවය කරන බවත්ය. වැලිවේරිය පොලිස් ස්ථානයේ සේවය කරන අවස්ථාවේදී නීති විරෝධී මත්පැන්, හෙරොයින් සහ ගංජා ජාවාරම්කරුවන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීම් කළ නිලධාරියෙක් වීම හේතුවෙන් විවිධ දේශපාලන හා පුද්ගලයන්ගේ බලපෑම් ඇති වූ බවත්, එබැවින් පුද්ගලයන්ව සහ ඔහුගේ අනුගාමිකයින් තමා සමඟ අමනාපයෙන් පසුවන බවත්, එම තත්වය මත තමාට ස්ථාන මාරුවක් ලැබී ඇති බවත්ය. මෙම පැමිණිලිකරුද අධික ලෙස මත්පැන් පානයට පුරුදු වූ අයෙක් බවත්, නිතර කෝලාහල කරන පුද්ගලයෙක් බවට දැනගන්නට ලැබුනු බවත් සඳහන් කර ඇත. තවද, මෙම පැමිණිලිකරුව තමා විසින් අත්අඩංගුවට ගෙන නොමැති බවද ප්‍රකාශ කර ඇත.

කෙසේ වෙතත් පළවන වගඋත්තරකරු අදාළ දිනයේදී පොලිස් ස්ථානයේ රාජකාරී කළ බවට පිළිගෙන ඇත.

දෙවන වගඋත්තරකරු ලෙස නම් කර ඇති පොලිස් ස්ථානාධිපතිවරයා ප්‍රකාශ කර ඇත්තේ, සහකාර පොලිස් අධිකාරීවරයා විසින් මෙම සිද්ධිය සම්බන්ධයෙන් තමාගෙන් දුරකථන පණිවිඩයක් මඟින් විමසූ බවත්, ඒ අවස්ථාවේදී මෙම සිද්ධිය පිළිබඳව කිසිදු සටහනක් තමා වෙත වාර්තා වී නොතිබූ බවත්ය. සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ස්ථානයට ඉදිරිපත් කරන අවස්ථාවේදී ඒ බව උපසේවක භාර නිලධාරියා තමාට දැනුම්දීම් කරන නමුත්, උක්ත දිනයේදී මෙවැනි පුද්ගලයෙක් අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කළ බවට තමාට දැනුම්දී නැති බවද ප්‍රකාශ කර ඇත. එසේම මෙවැනි පහරදීමක් සිදුකළ බවට කිසිදු පුද්ගලයෙකු පොලීසියට පැමිණිලි කර නොමැති බවද දක්වා ඇත.

අදාළ දිනයේදී වැලිවේරිය පොලිස් ස්ථානාධිපති විසින් සිදුකළ රාජකාරී වලට අදාළව තොරතුරු සටහන් පොත්වල උධෘත සහිත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙසට දැනුම්දී ඇතත්, එම වාර්තා කොමිෂන් සභාව වෙත ලබාදී නොමැත.

<u>නවාසිවායම් එදිරිව ගුණවර්ධන</u> **(1989) 1 SLR 394** ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවට අනුව පොලිස් නිලධාරියෙක් බස් රථය තුළ සිටි පෙත්සම්කරුට ප්‍රකාශයක් සටහන් කිරිම සඳහා ඔහු සමඟ පොලිසියට පැමිණෙන ලෙසට දන්වමින් ඉන් පසුව ඔහු සමඟ පොලිස් ස්ථානයට යාම සිදුකර ඇත. මෙහිදී ශ්‍රේෂ්ඨාධිකරණය සඳහන් කර සිටියේ පෙත්සම්කරුගේ ගමන වැළැක්වීම ද අත්අඩංගුවට ගැනීමක් බවයි.

මේ අනුව පැමිණිලිකරුව පොලිස් ස්ථානයට රැගෙන යාම තුළින් හා එහි රඳවා තබාගැනීම තුළින්ද අත්අඩංගුවට ගෙන රඳවා තබාගැනීමක් සිදුව ඇත.

**නිරීක්ෂණ :-**

අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව පැමිණිලිකරුගේ ශරීරයේ බරපතල ගණයේ තුවාල එකක් හා බරපතල නොවන තුවාල එකක් එනම්, වම් කනේ කර්ණපට හා පටලයේ (left tympanic membrane) සිදුරක් ඇති බවටත්, නාස් පොල්ල කැඩී ඇති බවටත් අධිකරණ වෛද්‍යවරයා වාර්තා කර ඇති බව නිරීක්ෂණය වේ.

තවද, රෝගියා විසින් අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් වීමේදී රෝගී ඉතිහාසය ලෙස පොලිස් නිලධාරීන් හතර දෙනෙකු විසින් අතින් හා පයින් පපුවට, කනට සහ බෙල්ලට පහරදුන් බව දක්වා ඇත. ඒ අනුව පැමිණිලිකරු දක්වන පහරදුන් ආකාරය තුවාල හා සැසඳෙන බව ද නිරීක්ෂණය වේ.

එසේම පැමිණිලිකරු පැමිණිල්ල වෙනුවෙන් ඉදිරිපත් කර ඇති අයි.පී චමින්ද පුෂ්පකුමාර යන අයගේ දිවුරුම් ප්‍රකාශය සහ යූ.එල් චමින්ද ප්‍රසාද් යන අයගේ දිවුරුම් ප්‍රකාශ මඟින් පහරදීම ඇසින් දුටු බවට ප්‍රකාශ වී ඇත.

ස්ථානාධිපතිවරයාගේ කරුණු දැක්වීමේදී සඳහන්වී ඇත්තේ, මෙවැනි සිදුවීමක් සම්බන්ධයෙන් සහකාර පොලිස් අධිකාරීවරයා තමාගෙන් විමසීමක් කළ බවයි. ඒ අනුව මෙවැනි සිදුවීමක් සිදුව ඇති බව නිරීක්ෂණය වේ.

පළවන වගඋත්තරකරුද අදාළ දින පොලිස් ස්ථානයේ රාජකාරියේ නියැළුනු බවට පිළිගෙන ඇත. තවද, පැමිණිලිකරුව පොලිස් ස්ථානයට රැගෙන ගිය බවට සටහන් පොලිස් ස්ථානයේ නොවූව ද, අනිකුත් සාක්ෂි මඟින් පැමිණිලිකරු පොලිස් ස්ථානයට රැගෙන ගිය බවට කරුණු නිරීක්ෂණය වේ.

නිගමනය :-

පැමිණිලිකරුගේ අධිකරණ වෛද්‍ය වාර්තාව මඟින් හා ඉදිරිපත් වී ඇති සාක්ෂි මඟින් ඔහුට අමානුෂික අන්දමින් පහරදීමක් සිදුව ඇති බවට තහවුරු වන බැවින් එමඟින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 11 වන ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත්, කිසිදු සාධාරණ හේතු දැක්වීමකින් තොරව පැමිණිලිකරුව පොලිස් ස්ථානයට රැගෙන ගොස් රඳවා තබා ගැනීම තුළින් 13(1) සහ 13(2) වන ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවත් මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලබයි.

නිර්දේශය :-

01. පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් සෘජුවම චෝදනා එල්ල වන පළවන වගඋත්තරකරු විසින් පැමිණිලිකරු වෙත රු. 75,000/- ක මුදලක් ගෙවීමට කටයුතු කළ යුතුය.

02. තවද වගඋත්තර පාර්ශවයේ මෙකී ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා සහ ඉහත පළවන වගඋත්තරකරු වෙත මෙම නිර්දේශය යොමු කිරීම සඳහා මෙහි පිටපතක් පොලිස්පති සහ අධ්‍යක්ෂ (නීති), පොලිස් නීති කොට්ඨාශය වෙතද යොමු කරනු ලැබේ.

2021. 12.08 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මැ/ජේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. අධ්‍යක්ෂ (නීති),
පොලිස් නීති කොට්ඨාශය,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

} ඉහත 02 නිර්දේශය අනුව කටයුතු කිරීමට

සැ.යු - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැළැස්විය යුතුය.

B/